(01). 1- 10 දක්වා ඇති සියලුම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න.

1. සිංහල හෝඩියේ ඇතුලත්
   (අ) වර්ගාන්ත (ආ) මුර්ධජ අක්ෂරය බැගින් ලියන්න
2. පහත සඳහන් පද දෙකෙහි අදහස පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
   (අ) පහන (ආ) පහණ

3. පහත වාක්‍යයේ වචන දෙකක අක්ෂර විනන්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස්කර ලියන්න
   ” බෝ මලුවේ සතර දිසාවෙහි තොරන සතරක් ද පිළිම සතරක් ද වේ ”

4. පහත පදවලට විරුද්ධාර්ථවත් පදය ලියන්න
   (අ) නේවාසික (ආ) ලෞකික

5. පහත දැක්වෙන අදහස්වලට ගැලපෙන තනිපදය බැගින් ලියන්න
   (අ) සහිත්‍ය කලා නිර්මාණ සඳහා අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම
   (ආ) පුරාණ කාලයට අයත්

6. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවලින් පළවන අර්ථය ලියන්න
   (අ) දියකාවගේ පිටේ ලුණු හැංගුවා වාගේ
   (ආ) හිසරදේට කොටවේ මාරු කරන්නා වගේ

7. මධ්‍යම පුරුෂයට අයත් සර්වනාම බහුවචන පද දෙකක් ලියන්න

8. ‘ නට ’ යන ක්‍රියා ප්‍රකෘතිය භාවිතයට ගෙන පහත සඳහන් ක්‍රියාරූප සකස් කර ලියන්න
   (අ) විධි ක්‍රියා (ආ) ප්‍රයෝජ්‍ය ක්‍රියා

9. අප්‍රාණවාචි නාම පදයක සහ ප්‍රාණවාචි නාම පදයක නාම ප්‍රකෘතිය සදා ගන්නා ආකාර දෙක ලියන්න

10. ත්+අa - තa ලෙස යෙදේ නම් පහත සඳහන් ව්‍යංඤ්ජන වලට මෙම ස්වර එක් වූ විට සැදෙන අකුර ලියන්න
    (අ) මි+ඔa ( ආ) මි+ ඓ

(02) පහත දැක්වෙන ව්‍යුහ අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු රචනයක් ලියන්න. මතෘකාවක් ද යොදන්න

(අ) මිනිස් ක්‍රියාකාරකම් නිසාත් ඔවුන් එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ නිසාත් අපගේ පරිසරය දූෂණයට ලක්වේ. මිනිසාගේ පහසුව සඳහා නිපදවා ගත් බෝහෝ භාණ්ඩ පරිසරයට හිතකර නොවේ. ප්ලාස්ටික් පොලිතින් වැනි දෑ ප්‍රතිචක්‍රීකරණය මගින් පරිසරය දූෂණය අවම කර ගත හැක.

(ආ) නිරෝගිකම උතුම්ම ලාභය බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. නිරෝගිකම පවත්වා ගන්නේ කෙසේ ද යන්න ගැන බොහෝ දෙනෙකුට ඇත්තේ අල්ප අවබෝධයකි. රෝග සුව කිරීම මෙන් ම වළක්වා ගැනීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. එය රජයේ හෝ වෙනත් සංවිධානගත ආයතනයක් මගින් පමණක් ඉටු කළ හැකි කාර්යයකට වඩා අප සියලුදෙනා ම විසින් අවබෝධයකින් යුත්තව කළ යුතු කාර්යයකි.

(ඇ) මාධ්‍යවේදිනු නිතර ම තම නිදහස ගැන කතා කරයි. එසේ නම් ඔහුන්ගේ යුතුකම විය යුත්තේ නිදහස භුක්ති විඳිමින් රටේ ඉදිරි ගමන අත හිත දිම ය. එහෙත් විද්‍යුත් නාලිකාවන් වන රූපවාහිනිය මෙම වගකීම නොකරන බව පවසන්නේ කණගාටුවෙනි. සිංහල භාෂාව ගැන නොතැකීමෙන් අපේ සාරධර්ම පද්ධතියම විනාශ මුඛයට යමින් පවතින බව පෙනේ.

(ඈ) සියලුම ජීව පද්ධතිවල පැවැත්ම සඳහා ජලය අත්‍යවශ්‍ය වේ. පෘතුවිතලයේ ජලය කොතෙක් තිබුණ ද ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය ඉතා ස්වල්ප වේ. අද වන විට ලෝක ජනගහනයෙන් විශාල පිරිසක් ජල අර්බුදය හේතුවෙන් පීඩාවට පත්ව සිටිති. ශ්‍රී ලංකාවාසි අපට ද ජලය අරපිරිමැස්මෙන් යුතුව පාවිච්චි කිරීමට සිදුව ඇත.

(03) පහත දැක්වෙන පාඨය වචන 45 – 50 අතර ප්‍රමාණයකින් යුත්ත වන සේ සාරාංශ කර ලියන්න. ඔබේ සාරංශයේ ඇතුලත් වචන ගණන පිළිතුර අග ලියන්න.

සිංහල සාහිත්‍යයේ වර්තමාන යුගය වනාහි යම් යම් කරුණු අතින් සලකන විට පැරණි යුගයන්ට වඩා විසිතුරු යැයි කිව හැකිය. අප සාහිත්‍යයෙහි දැන් සිදු වන්නේ පෙර ශත වර්ෂ විස්සක් මුළුල්ලෙහි සිදු නොවූ විරූ විපර්යාසයකි. අපේ පැරණි සාහිත්‍ය වැඩුණේ සංස්කෘත සාහිත්‍යයේ හා පාළි සාහිත්‍යයේ ආශ්‍රයෙනි. දැන් එය කෙරේ බලපාන්නේ අමුතු මුහුණු වර ඇති නානා දෙසින් එන විවිධ අංශවලින් යුත් සාහිත්‍ය විශේෂයි. එහෙයින් වර්තමාන ලේඛකයා තම ඥාන පිපාසය සංසිදුවා ගැනීමට පැරණි සාහිත්‍ය උල්පත් කරා බෙහෙවින් නොයයි. ඔහුගේ නිර්මාණ ශක්තිය පැන නැගීමට මුල් හේතුව වනුයේ බටහිර සාහිත්‍යයෙන් ලැබෙන පෝෂණයයි. පෙර නොවූ විරූ සාහිත්‍යාංගයන් දැන් ඇතුලත් වීම වූ කලී අපේ වර්තමාන සාහිත්‍යයේ ඇති විශේෂ ලක්ෂණයකි. මෙකල පහළ වී ඇති ඊතා වැදගත් කෘති නිපදවුයේ බටහිර සාහිත්‍ය උද්‍යානයේ නිතර සංචාරය කොට එහි පිපී නිබෙන විසිතුරු පුෂ්ප වර්ගයන්ගේ සුවඳ බොහෝ සෙයින් ම ආඝ්‍රාණය කළ ලේඛකයන් බව යුත්ති යුත්තය.

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විශ්වකෝෂය වූ කලී විශ්ව ඥානය එක්තැන්කොට ක්‍රමානුකූල රටාවකට පිළියෙල කරනු ලබන විමර්ශන ග්‍රන්ථයකි.
එය අතීතයේ මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් සම්පාදනය වුවද වර්තමානයේ පරිගණක මෘදුකාංග, සංයුක්ත තැටි, වෙබ් අඩවි වශයෙන් නවීන තාක්ෂණාකූලව එළි දැක්වේ. සෑම විෂය ක්ෂේත්‍රයකට ම අයත් වන වැදගත් මාතෘකා පිළිබඳ නිවැරදිවුත් සත්‍යවුත් සම්පූර්ණ තොරතුරු හා කරුණු සහිත විස්තරයක් විශ්වකෝෂයක අන්තර්ගත වේ. විශ්වකෝෂයක

ඇතුලත් වන විස්තර අපක්ෂපාතී ය. ස්වාධින ය. එමෙන්ම විශ්වකෝෂයක පෞද්ගලික මත ප්‍රකාශ නොකරේ . විශ්වකෝෂයක අන්තර්ගතය හා අරමුණ ශබ්දකෝෂයක සහ පර්යාය කෝෂයක අන්තර්ගතයට හා අරමුණට වඩා වෙනස්ය. ශබ්දකෝෂයකින් සිදු වන්නේ අදාල භාෂාවේ වචන ආකාරාදී පිළිවෙළට පෙළගස්වා එහි අරුත නිරුත හා උදාහරණ වාක්‍යාංශ ඉදිරිපත් කර එකි වචන පිළිබඳව පමණක් විස්තරයක් ලබාදීමය. පර්යාකෝෂයකින් සිදුවන්නේ අදාළ භාෂාවේ වචනවලට පර්යායවාචි පද සැපයීමයි.

1. විශ්වකෝෂයක් යනු කුමක්ද ?
2. වර්තමානයේ විශ්වකෝෂ එළි දැක්වෙන්නේ කෙසේද ?
3. මෙහි සඳහන් වන පරිදි විශ්වකෝෂයක ඇතුළත් වන තොරතුරු පිළිබඳ ඔබට කිව හැක්කේ කුමක්ද ?
4. ශබ්දකෝෂයකින් සිදු කෙරෙන කාර්යය කුමක්ද ?
5. මෙහි සඳහන් කෝෂ ග්‍රන්ථ ප්‍රමාණය කොපමණද ?

(05) ඔබේ පාසලේ බෞද්ධ සංගමය මගින් පසුගිය දා පැවැත්වූ නාට්‍ය තරගයෙන් ඔබේ පාසලට ප්‍රථම ස්ථානය හිමි වී ඇත ඒ පිළිබඳ විස්තර ඇතුලත් කරමින් පුවත්පත් වාර්තාවක් ලියන්න.( වචන 100 ක් පමණ )

නැතහොත්

විද්‍යාලයේ ක්‍රීඩා උත්සවය සඳහා න්‍යායපත්‍රයක් සකස් කරන්න. ක්‍රීඩා උත්සවය ප.ව 2.00 ට ආරම්භ වේ.

www.lkedu.lk

## සිංහල භාෂාව III

(01). 1- 10 දක්වා ඇති සියලුම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න.

1. (අ) ගුත්තිල කාව්‍ය රචනා කරන ලද්දේ කවර සහිත්‍ය යුගයේ ද ?
   (ආ) ගුත්තිල කාව්‍යයේ රචකයා නම් කරන්න.

2. (අ) පන්සිය පනස් ජාතක පොත සඳහා මූලාශ්‍ර කරගත් ග්‍රන්ථය කුමක්ද ?
   (ආ) එහි සඳහන් දිගම ජාතකය කතාව කුමක්ද ?

3. පහත සඳහන් රජවරු පාලනය කළ රට නම් කරන්න.

   (අ) චුලනී බ්‍රහ්මදත්ත රජු
   (ආ) වේදේහ රජු

4. ” පින්වත්නී, නොයව මම ගොවියා පුතු නොවැන්දෙමි ”

   (අ) ගොවියා පුතු යනු කවරේක්ද ?
   (ආ) මෙය ප්‍රකාශ කළේ කවරෙක්ද ?

5. ගුත්තිල මහ සිපි
   සක්දෙව් බසින් සැහපී
   .....
   .....
   (අ) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) ගුත්තිල කාව්‍ය පදනම් වූ ජාතක කතාව කුමක්ද ?

6. ” මහරජ නොසිතා වදාළ මැනව, මාගේ බලවත් අනෙක් උපායක් ඇත ”
   (අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථා කුමක්ද ?
   (ආ) මෙහි සඳහන් අනෙක් බලවත් උපාය වූයේ කුමක්ද ?

7. පන්සිළු විණා නද පසු බැස් වූ
   මාගේ පිනවත වෙණ නදයෙන් ගොස් වූ
   නන් දන කැන් දුටුවද බිය සිස් වූ
   මින් රළ වුන් ගං වෙරළට රැස් වූ
   (අ) පන්සිළු යනු කවරේක් ද ?
   (ආ) මෙහි සඳහන් පරිදි ගුත්තිල පඬිතුමාගේ විණා වාදනයේ මිහිරියාව නිසා සිදු වූ විශේෂ සිදුවීම කුමක් ද ?

8. වර වෙණ නද අසමින් සිත සතොසිනි
   සර හැර සියොතුන් පියපත් විදිමිනි
   පුරඹර වසමින් සිටි රග කුටි වැනි
   සුර සෙනගට සුරසුන් පැන වූ වැනි
   (අ) මෙම කවියේ සඳහන් උපමාව සහ උපමේය ලියන්න
9. (අ) ජාතක කතාවක ඇති ආකෘතිමය ලක්ෂණ දෙකක් ලියන්න.
   (ආ) ජාතක කතා පොත රචනා කිරීම සඳහා අනුග්‍රහය දැක්වූයේ කවරෙක් ද?

10. ජාතක පොත ඇසුරෙන් බිහි වූ කාව්‍ය ග්‍රන්ථයක් සහ ගී කාව්‍ය ග්‍රන්ථයක් නම් කරන්න.

www.ikedu.lk